දුකින් මිදීම සඳහා

අති පූජ්‍ය මාන්කඩවල සුදස්සන හිමියන් විසින්

කරන ලද දේශනා ඇසුරෙනි

පුණ්‍යානුමෝදනාව

මෙම පොත මුද්‍රණයෙන් හා කියවීමෙන් ජනිත වූ සියළු කුසල් මිය පරලොව ගිය ඥාති මිත්‍රාදීන් ට අනුමෝදන් වේවා. තවද අප සියළු දෙනාටම මේ ගෞතම බුද්ධ සාසනයේදීම නිවන් දකින්නට හේතු වේවා

මෙය ලබුනෝරුව කන්ද අරණ්‍ය සේනාසනයෙහි අති පූජ්‍ය මාන්කඩවල සුදස්සන හිමියන් විසින් කරන ලද දේශනයක් ලිඛිත මාධ්‍යයෙන් ඔබ අතට පත් කිරීමකි. දේශන විලාශයෙහි එන හඬ හැසුරුම් කියවීමේදී හමු නොවන බැවින් ගැටළු සහගත තැන් ඔබට හමුවිය හැකිය.

එහෙත් මෙයින් ලබාගත හැකි ධර්මාවබෝධය අති විශාල බැවින් ප්‍රවේශමෙන් කියවා තේරුම් ගන්නට උත්සහ කරන මෙන් කාරුණිකව ඉල්ලමු.

තෙරුවන් සරණයි !

ශ්‍රද්ධා බුද්ධි සම්පන්න කාරුණික පින්වතුනී,

මේ පින්වත් සියලු දෙනා දැන් සූදානම් වෙන්නේ තමන්ගේ වටිනා මනුෂ්‍ය ජීවිතේ තවත් වටිනා බවට පත් කර ගන්න ඒ වගේම මේ ලබපු මනුෂ්‍ය ජීවිතේ හිස් නොවන විදියේ අර්ථාන්විත තත්වයට පත් කර ගන්න තමන්ට හේතු කාරනා වන වටිනා සද්ධර්මය බිඳක් ශ්‍රවනය කරන්න. දන්දෙන කෙනෙකුට මෙලොවදී ම ලැබෙන ආනිශංස රාශියක් බුදුරජාණන් වහන්සේ පෙන්වා වදාලා. ඒ අතරින් මේ පින්වතුන්ට දිට්ඨ ධම්ම වේදනිය වශයෙන් මෙලොවදී ම ලැබෙන ආනිශංසයක් වුනා කල්‍යාන මිත්‍ර ඇසුර ඇසුරු කරන්නට ලැබෙන බවත් සසර දුකින් අත මිදෙන්න උපකාර වන සද්ධර්මය ශ්‍රවනය කරන්න ලැබෙන බවත් ඒ නිසා පින්වතුන් දැන් මේ සූදානම් වෙන්නේ සසර දුක් ගිනි නිවීම පිණිස ලොව්තුරා බුදුරජාණන් වහන්සේ දේශනා කල සද්ධර්මයෙන් බිඳක් ශ්‍රවනය කරන්න.

හැම දෙනාම මේ කය නිසලව තියෙනවා වගේ සිතත් නිසල කරගෙන සන්සුන් කරගෙන නොයෙක් නොයෙක් අරමුණුවල සිත දුවන්ට නොදී බොහොම හොඳින් මේ දහම අහන්න ඕනෙ. සිහි කරන්න ඕනෙ.

කුමක් නිසා ද පින්වතුනි?, අප හැම දෙනා ම නොදන්නවා වුනාට අති දිර්ඝ කාලෙක ඉදලා අති දිර්ඝ මේ සංසාරේ තුල ඉදගෙන අපි හැම කෙනෙක් ම නොයෙක් විදියේ ක්‍රම උපායන් හොයමින් ජීවිතයේ දුක අයින් කරගන්න වෙහෙසුනු අය. ඒත් අපි හැම දෙනාටම ජීවිතය තුලින් ලබාගන්න නොහැකිවුණු නොහැකිවන කරුණක් දුක් සහගත බව ජීවිතවලින් අයින් කර ගන්න. සැප සැනසිල්ල කියන ඒක අපේ ජීවිත වලට ලගා කර ගන්න. ඒකට හේතුවක් මේ මුලු ලෝකයේ ම දුක නැති කරන්න හදන්නේ දුක ඇති වෙලා තියෙන්නේ කොහොම ද කියන කාරණාව තේරුම් ගෙන නෙමෙයි. දුක ඇතිවන කාරණාව පැත්තකින් තැබ්වා දුක කියන ධර්මතාවය මොකක්ද කියන ඒක තේරුම් ගෙන නෙමෙයි. ඒකත් පැත්තකින් තැබ්වා තමන් කරන්නේ මොකක්ද කියන කාරණාවවත් තමන් තෝර ගෙන නෙමෙයි.

ඉතින් මේ විදියේ මුලා බවකට අපිට පත්වෙන්න වුනේ අපි පත්වුනේ මේ සසර දුක නිමා කරන සද්ධර්ම අවබෝධය අපිට නොලැබුනු නිසයි. ඒ නිසා අද දවසේ දී මේ ජීවිතයේ අපි කොහොම හරි සද්ධර්මය අවබෝධ කර ගන්න ඕනෙ. ඒ සඳහා බොහෝ ම වටිනා අවස්ථාවක් අපිට හම්බ වෙලා තියෙනවා. බුද්ධෝත්පාද කාලයේ ඒ වගේම මනුෂ්‍ය ජීවිතේ සද්ධර්මය පවතින වට පිටාවක.

ඇයි මේ සද්ධර්මය අපි අවබෝධ කර ගත යුත්තේ? ඒ සද්ධර්මය අවබෝධ කර ගන්න ඇයි අප වෙහෙසෙන්න ඕනෙ?

මෙන්න මේ කාරණාව අපට තේරුම් යන්න ඕනෙ මේ කාරණාව තේරුණොත් විතරයි. අපි සද්ධර්මයට කැමති වෙන්නේ ඒ කාරණාව තේරුම් යන්න නම් අකමැත්තෙන් වුනත් සද්ධර්මය අහන්න වෙනවා. කල්‍යාණ මිත්‍ර ඇසුර තියෙන්නේ ඒ නිසයි. සද්ධර්මයට රුචිකත්වය නැති බෙහෙවින් හිත නොනැමුනත් අපේ කල්‍යාණ මිත්‍ර ඇසුර අපිව සද්ධර්මයට යොමු කරවනවා. අහම්බෙන් නමුත් යොමු කරවන කොට ඒ සද්ධර්මය අපට තේරුණාම එදා ඉඳලා අපිට අපේ කැමැත්තක් ඇති වෙනවා.

ඒකට හොඳ නිදසුනක් අපේ බුදුරජාණන් වහන්සේ කාශ්‍යප බුදුරජාණන් වහන්සේගේ කාලයේ සටීකාර කියල මානවකයෙක් වෙලා උපන්නා, හැබැයි බොහොම පහත් කුලයක රොඩි කුලයක. මෙයාට බ්‍රහ්මණ කුලයේ උපන්න යාලුවෙක් හිටියා ජෝතිපාල කියලා. මේ දෙන්නා හරිම යාලුයි, හරිම විශ්වාසවන්තයි. හැම කටයුත්තක්ම කරන්නේ දෙන්නා ඒකට එකතු වෙලා. ඒ වුනාට මේ රොඩි කුලේ උපන්නත් සටීකාර හරි ම බුද්ධිමත්. එයා කාශ්‍යප බුදුරජාණන් වහන්සේගෙන් බණ අහලා ශ්‍රද්ධාව ඇති කරගෙන අනාගාමි වෙච්ච කෙනෙක්. තමන්ගේ යාලුවට කිව්වා කාශ්‍යප බුදුරජාණන් වහන්සේ අසවල් තැන වැඩ ඉන්නවා අපි ගිහින් බණ අහමු කියලා. නමුත් කැමති වුනේ නැහැ. කිහිප වතාවක් ම කිව්වා කැමති වුනේ නැහැ. බුද්ධත්වය කියන එක ඔහොම ලබන්න පුලුවන් එකක් නෙමෙයි. ඔය මුඩු මහණට මොන බුද්ධත්වයක් ද කියලා මේ විදියේ නොයෙක් නින්දා අපහාසත් කළා.

ඊට පස්සේ සටීකාර මානවකයා කියනවා එහෙනම් අපි නාන්න යමු කියලා. ජෝතිපාල මානවකයයි දෙන්නා නාන්න ගියාට පස්සේ නනා ඉන්න ගමන් ජෝතිපාල මානවකයගේ කෙස් වැටියෙන් අල්ලා ගන්නවා. සටීකාර අල්ල ගෙන වතුරේ ඔබාගෙන ඉන්නවා. කාශ්‍යප බුදුරජාණන් වහන්සේ හම්බවෙන්න යන්න එන්නේ නැත්නම් අත හරින්නේ නෑ කියලා. ඊට පස්සේ දඟලලා දඟලලා මම එන්නම් අත අරින්න කිව්වා.

ජෝතිපාල මානවක කල්පනා කරනවා මම බ්‍රහ්මණ වංශයේ උපන්න යහලුවෙක් උනත් සටීකාර රොඩී වංශයේ ඉපදුන කෙනෙක්. කෙස් වැටියෙන් අල්ලනවා තියා කෙනෙක් හිතන්නේවත් නෑ. මගේ යහලුවා මෙහෙම කළේ ඒ කාන්තයෙන් ම විශාල අර්ථයක් ඇතුව. (අපි වගේ මොඩ කමට කිපුනේ නැහැ) මොකක් ද මේකේ හේතුව කියලා බැලුවා. පටිසයක් තරහවක් ඇති කර ගත්තේ නැහැ. බැලුවා බලලා කාශ්‍යප බුදුරජාණන් වහන්සේ ලඟට එක්කන් ගිහින් කිව්වා ස්වාමීනි මේ ජෝතිපාල මගේ යාලුවෙක් මෙයාටත් භාග්‍යවතුන් වහන්සේ බණ ටිකක් කියන්න කියලා.

ඉතාමත් සුලු ධර්ම දේශනාවක් කරන කොට බොහෝ සෙයින් පින් පිරුණු මේ ජෝතිපාල මානවකට ඒ සද්ධර්මය අවබෝධ වුනා. අවබෝධ වෙනකොට සර්කාරගෙන් අහනවා, ඇයි ඔබ මෙවැනි ශාසනයක පැවදි වෙන්නෙ නැත්තේ කියලා? ඊට පස්සේ කියනවා මගේ අම්මගෙයි තාත්තගෙයි දෙන්නාගෙම ඇස් පෙන්නේ නැහැ ඒ දෙන්නට සලකන්න කෙනෙක් නැති හින්දා මං ගෙදර ඉන්නේ, නැත්නම් මම මහණ වෙලා කියලා. එහෙනම් මම මහණ වෙනවා කියලා ජෝතිපාල මානවක සාසනේ පැවදි වෙලා තෙවලා දහම ත්‍රිපිටක ධර්මය සම්පූර්ණයෙන්ම ඉගෙනගෙන ධාන්‍ය අභිඥා ඉගෙන ගෙන තව බුදු කෙනෙක් පහල වුනා වගේ දිවි ඇතිතාක් ත්‍රිපිටකය භික්ෂූන් වහන්සේලාට ඉගැන්නුවා කියලා සඳහන් වෙනවා.

එතකොට බලන්න කළ්‍යාණ මිත්‍ර ඇසුර නිසා සද්ධර්මයට ගරු නොකල සද්ධර්මයට කැමති නොවුනු කෙනාගේ මනසත් කැමති වෙච්ච හැටි.

ඉතින් මේ පින්වතුන්ගේ මේ පින්වතුන්ට අනුකම්පා කරන තමන්ගේ දරුවෝ ඥතින් විසින් මේ පින්වතුන්ට සද්ධර්මය අහන්න යොමු කළා. මේ පින්වතුනුත් මෙයින් ප්‍රයෝජනයක් ගන්නට ඕනේ කියලා හිතලා බොහොම හොඳින් බොහොම උවමනාවෙන් මේ ටික ශ්‍රවනය කරන්නන ඕනේ.

පින්වතුනි, මම අද ධර්ම දේශනාව සඳහා මාතෘකා කලේ වටිනා ගාථාවක් බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා "**ධනං ධජේ අන්ගං රක්කමානෝ** " මේ ලෝකයා තමන්ගේ අඟපසඟ රැකගන්න ධනය අතහරිනවලු. මේ ශරීරයේ කොටසක් නැතිවෙන්න ගියොත් ඒක බේර ගන්න ගෙවල් දොරවල් වුනත් මිල මුදල් උනත් අපි අත හරින් නැද්ද? අතහරිනවා. වකුගඩුවක් නරක් වෙලා ඒක දාන්න ඕනේ කිව්වොත් තියෙන දේවල් විකුණලා හරි කරනවා. "**ධනං ධජේ අන්ගං රක්කමානෝ** " ධනය අත හරිනවා ශරීර අඟපසඟ රැක ගන්නවා. "**අංගං ධජේ ජීවිත රක්ක මානෝ** " සමහරු ශරීරයේ කොටස් අත හරිනවා ජීවිතේ රැක ගන්න. මේ දේ අත හැරියේ නැත්නම් ජීවිතේ නැති වෙනවා කිව්වොත් ඒ කොටස අත හරිනවා ජීවිතේ රැකගන්න. "**ජීවිතං අංගං ධනං ධජේ ධං මනුෂ්‍ය ගන්තෝ**" ධර්මය සිහි කරන ධර්මයට ගරු කරන ශ්‍රේෂ්ඨ පුද්ගලයා ජීවිතයයි ධනයයි අංගයි කියන මේ තුනම අත හරිනවලු ධර්මය අභියසදී.

ඒකට හොඳ කථාවක් තියෙනවා. මේ කතාව ඉස්සර වෙලා ම කියන්නම්. මේ ලංකාවේ බෝහෝම ධනවත් සිටු පවුලක් හිටියා. ඒ සිටු දෙමහල්ලන්ට හිටියා බොහො ම පින්වත් පුත්තු දෙන්නෙක්. ඉතින් මේ දරු දෙන්නා ටිකක් ලොකු වෙනකොට ඒ දරුවන්ට තමන් සතු සියලු ම ධනය

සමානව බෙදලා දුන්නා. මේ දෙමව්පියෝ දීලා නොබෝ කලකින් ඒ දෙමව්පියෝ දෙන්නා කලුරිය කලා.

ඉතින් මේ අයියයි මල්ලියි දෙන්නා දැන් මේ සිටු දෙමහල්ලන් සතු ධනය පරිහරණය කරමින් ජීවත් වෙනවා. අයියගේ නම තිස්ස. තිස්ස ටිකක් හරි අමුතු විදියට හිතනවා ජීවිතය ගැන. ඉතින් මනුෂ්‍යයෝ විහාරස්ථාන වලට ගිහිල්ලා හවසට මල් පහන් අරගෙන යන කොට මෙයා කල්පනා කරනවා ඇයි මේ මනුෂ්‍යයෝ මල් පහන් අරගෙන යන්නේ මොකක් හරි මේකේ තේරුමක් ඇති කියලා. මෙයත් ඒ පස්සෙන් දුවනවා. ඉතින් ගිහිල්ලා බණ ඇහුවා. අහන කොට ජීවිතේ හරි අමුත්තක් තේරුණා. ඉතින් කාලයක් මෙහෙම බණ අහන්න පුරුදු වුනා. බණ අහනකොට තිස්සට තේරුණා යම් තරුණකමක් මහළුකමෙන් අවසන් වෙනවනම් මේ තරුණ කමෙන් පලක් නෑ නේද? නින්දා වේවා. යම් ජීවිතයක් මරණයෙන් අවසන් වෙනවා නම් මේ ජීවිතයෙන් පලක් නෑ තේරුමක් නෑ නේද? මේ ජීවිත නින්දා වේවා. යම් එක් වීමක් වෙන් වීමකින් අවසන් වෙනවනම් ඒ එකවීමෙන් පලක් නැහැ නේද කියලා මේ වගේ ජීවිතේ ලෝකයා හිතන දේට වඩා ටිකක් වෙනස්ව හිතන්න හුරු වුනා. අනන්ත ජාති සංසාරික වූ ජරා මරණ දුක තමන්ගේ පිටුපසින් වධකයෙක් වගේ හඹාගෙන ආවා කියන එක මෙයාට ටික ටික තේරෙන්න පටන් ගත්තා.

පසුව විහාරස්ථානයට ගිහිල්ලා කිව්වා ස්වාමිනි මාව මහණ කරන්න කියලා. ඊට පස්සේ භික්ෂූන් වහන්සේලා අහනවා තිස්ස ඔයා අවසර අරගෙනද ආවේ? ගෙදර කවුරු හරි ඉන්නවද අවසර ගන්න. ස්වාමිනි මට එකම එක මල්ලි කෙනෙක් ඉන්නවා. ඒ මල්ලිගෙන් අවසර ගත්තද කියලා ඇහුවා ම, නැහැ ස්වාමිණී. එහෙනම් තිස්ස යන්න ගිහින් මල්ලිගෙන් අවසර ගෙන එන්න කිව්වා. මේ තිස්ස ගෙදර ගිහිල්ලා මල්ලි ගාවට ගිහිල්ලා කියනවා, මල්ලි මේ ජීවිතය හරි ම නිසරුයි ජරා මරණෙන් අවසන් වෙනවනම් ඒ අපේ ජීවිතයේ තේරුමක් නැහැ. ඒ හින්දා මල්ලි මට මහණ වෙන්න ඕනේ කියලා. ඒ පාර ඒ මල්ලි අඩන්න පටන් ගත්තා. අයියයි මායි විතරයි හිටියේ අම්මා තාත්තත් නෑ. මට අයියා, අයියා විතරක් නෙමෙයි. මට අම්මත්, මට තාත්තත්, අනිකුත් ඥාතීන් ඔක්කොම ඔයයි. ඒ හින්දා අනේ අයියේ මහණ වෙන්න නම් එපා. මගේ ධනයත් ඕනේ නම් ගන්න කියලා මල්ලි කිව්වා. මල්ල විවාහ වෙලා හිටියේ. අයියා ගොඩක් කරුණු කියලා අන්තිමට කිව්වා මල්ලි මං සතු සියලුම ධනය ඔයා ගන්න මට එක ම එක දෙයක් දෙන්න. මොකක් ද කිව්වා, මට මහණ වෙන්න අවසර විතරක් දෙන්න කිව්වා.

මෙහෙම නැවත නැවත කරදර කරන කොට මල්ලි අඬ අඬා අයියගේ කැමැත්තක් එහෙනම් කරන්න. මහණ වෙන්න අවසර දුන්නා.

ඒ අයියගේ සියලුම ධනයත් මල්ලිට පවරලා දීලා අයියා විහාරස්ථානයට ගිහින් මහණ වුනා. මහන වෙලා තමන්ගේ වැඩිහිටි ගුරුවරුන්ගෙන් බණ දහම් කමටහන් ඉල්ලගෙන පාංශුකූල චීවරයක් පොරව ගත්තා. පාත්තරයක් අතට ගත්තා. ඉතාමත් ඈත කැලේ ඇතුලේ ගල් ලෙනකට ගියා.

උදෑසන ගමට ගිහිල්ලා පිඬුසිඟා වඩිනවා. හම්බ වෙන පිණ්ඩපාතේ රස දෙයක් ද, නීරස ද කියලා බලන්නේ නෑ. සිහිල් වෙච්ච දෙයක් ද, රස්නේ දෙයක් ද කියලා බලන්නේ නැහැ. හුදෙක් දිවි පැවැත්ම පිණිස ම පිණ්ඩ පාතය ඇසුරු කලා. අප්‍රමාදිව මේ වන අරණේ ගල් ලෙනට වෙලා භාවනා කරනවා.

ඔහොම ඉන්න අතර මල්ලිගේ බිරිඳට එක්තරා විදියේ ක්ලේෂයක් ඇති වුනා. අයියගේ තියෙන සියලුම ධනය අපට පවරලා දීලා මහණ වුනේ, මහා විශාල ධනයක් තියෙනවා. බැරි වෙලාවත් පැවදි ජීවිතේ ගැන කල කිරිලා ආයෙත් ගෙදර ආවොත් මේ ධනය එයාට දෙන්න වෙනවා. මේ ධනය ගන්න එන්න ඉස්සෙල්ලා කොහොම හරි උපායකින් මෙයාව මරන්න ඕනේ කියලා මල්ලිගේ බිරිඳ අදහස් කර ගත්තා. කරගෙන මල්ලිට හොරෙන් හොරු කණ්ඩායමක් ගෙනල්ලා හොරුන්ට විශාල අල්ලසක් දීලා කිව්වා, අසවල් කැලේ අසවල් ලෙනේ ඉන්නවා තිස්ස කියලා හාමුදුරුනමක් මෙන්න මේ හාමුදුරුවන්ව මරන්න ඕනේ. මරලා ආවාම මම මීට වඩා තව වැඩිපුර මුදලක් දෙනවා කිව්වා.

ඉතින් මේ ලෝකයේ මුදල ලැබෙන කොට මුදල සඳහා ඕනෙම දෙයක් කරන්න සූදානම් පිරිසකුත් ඉන්නවා. මිත්‍යාදෘෂ්ටි මේ අය භාරගත්තා. භාරගෙන කැලේ ගල්ලෙනට ගියා තිස්ස හාමුදුරුවෝ මරන්න. තිස්ස හාමුදුරුවෝ යනකොටත් බොහොම විර්යයෙන් භාවනා කරනවා. මේ ඔක්කොමලා වට කරගත්තා තිස්ස හාමුදුරුවන්ව. තිස්ස හාමුදුරුවෝ අහනවා උපාසකවරුනි කුමක් නිසා මෙහාට ආවද? අපි ආවේ ඔබ වහන්සේව මරන්න කිව්වා. මාව මරන්නේ ඇයි? මාව මැරීමෙන් ඔබට එන ලාභය මොකක් ද? ඔබ වහන්සේ මැරුවාම අපට විශාල ධනයක් හම්බ වෙනවා. ඒ නිසා මරන්න ආවේ කිව්වා. මැරුවට කමක් නැහැ, එත් මට එක දවසක් දෙන්න. තව එක දවසකින් පස්සේ මාව මරන්න කිව්වා. ඊට පස්සේ මේ හොරු කියනවා නෑ නෑ ඔය එක දවසක් අපෙන් ඉල්ලන්නේ අපේ ඇස්වහලා පැනලා යන්න. කපටි කමට එක දවසක් වත් දෙන්න බැහැ. දැන් අපි ආපු කාරණය කරනවා කියලා කඩුව ඇදලා ගත්තා.

ඊට පස්සේ කියනවා තිස්ස හාමුදුරුවෝ ඇවැත්නි, උපාසකයිනි, එක දවසක් මට දෙන්න. ඒ වෙනුවට මං ඔබට ඇපයක් දෙන්නම් කියලා .මේ කැලේ කවුද ඔබ වහන්සේට ඇප වෙන්නේ කියලා ඇහුවා. ඉඳගෙන ඉන්න ආසනේට එහා පැත්තේ තිබුනා මහා විශාල කළු ගලක්. අපහසුවෙන්

මේ කළු ගල ඔසවලා අරගෙන තමන්ගේ කකුලේ කලවා ඇට දෙකට වේගෙන් ගහලා ඇට දෙක බිඳ ගත්තා. ඇවැත්නි, මේ ඇපය ඇද්ද කියලා ඇහුවා. මේ හාමුදුරුවන්ගේ ක්‍රියාව ගැන හරිම සංවේගයක් ඇතිවෙච්ච හොරු හරිම සංවේගෙන් ඇති ස්වාමිනි කියලා යන්න ගියා.

දැන් ඉතින් සක්මන් කරන්නත් බැහැ. ආපහු කොහාටවත් යන්නත් බැහැ. මේ තිස්ස හාමුදුරුවෝ ඒ කකුලේ කකුල කැඩිම නිසා ඇති වෙච්ච වේදනාව අරමුණු කරලා සියලු කෙලෙස් නසලා රහත් බවට පත්වුනා. ඒ කකුලේ කලවා ඇට බිඳගන්න ඉස්සර වෙලා එයා නුවණින් කල්පනා කරනවා, කෙලෙස් සහගතව ජීවත් වෙනවට වඩා දැහැමි මරණය වටිනවා කියලා බුදුහාමුදුරුවෝ දේශනා කලා. ඒ නිසා කෙලෙස් සහගත ව කලුරිය කිරීමත් නින්දා සහගතයි. අනන්ත සසරේ ඉන්න කොට මෙහෙ ම එක සැරයක් නෙමෙයි කකුල් කැඩෙන්න ඇත්තේ. ඕනේ තරම් මේ කකුල් දෙක කැඩෙන්න ඇති. ඒ ධර්මය වෙනුවෙන් මං මේ කකුල් දෙක කඩා ගත්තට කමක් නෑ කියලා තිරණය කරලයි කකුල කඩා ගත්තේ.

පින්වතුනි, අපට තියෙනවා හිතන්න ජීවිතය ගැන ගොඩාක් දේ මේ තුලින්. ඒ හාමුදුරුවෝ සද්ධර්මයට ජීවිතේ පුජා කරලා ඒ වගේ ක්‍රියාවකට පැමිණුනේ පින්වතුනි මේ අනවරාග්‍ර වූ සංසාරේ ගැන යම් පමණක හෝ දැනුමක් අවබෝධයක් තිබුනු නිසායි. ඒත් ඒ දැනුම අවබෝධය අපට නැති නිසයි, අපි බයක් සැකක් නැතිව මේ ජීවිතේ ජීවත් කරන්න ගෙවන්නේ.

ඉතින් මේ සද්ධර්මය අපිට හරියට තේරුණොත්, අපි වුනත් අපේ ජීවිතය සද්ධර්මයට පුජා කරන්න මැලිවෙන්නේ නැහැ.

පින්වතුනි, බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා

"අනම තග්ගෝ යං භික්ක වේ සංසාරෝ පුබ්බා කෝටි න පඤ්ඤායතේ අවිද්‍යා නිවරණානං තන් හා සංයෝජනං සන්ධාවතං සංසරිතං මවන්චේ වත මහා කංච"

මහණෙනි, මේ සසර අති දිර්ඝයි. මේ අති දිර්ඝ සංසාරේ පුර්ව කෙලවරක් හොයන්න බැහැ. ඒ දිර්ඝ සංසාරේ එන කොට, තමන්ට ඇඟ ලේ කිරි කරලා තමන්ගේ මව්වරුන්ගේ දුකට හඬපු කඳුළු එකතු කරන්න පුළුවන් නම්, සතර මහා සාගර ජලයට වැඩි යි කියලා පෙන්නුවා. දහඩිය මහන්සියෙන් හම්බ කරලා තමන් ව පෝෂණය කල පියා ඒ වගේ ම තමන්ගේ තුරුලේ තියාගෙන බොහෝ ම සෙනෙහසින් හදපු දුව පුතා වැලි කෙලියේ පටන් තමන්ගේ ලඟින් හිටපු සහෝදරයා සහෝදරී අනෙක් ඥාති හිතෛෂීන් මැරෙන කොට ඒ දුකට පපුවේ අත් ගසමින් අඬනකොට ඒ ගැලු කඳුළු සතර මහා සාගර ජලයට වැඩියි කියලා බුදුරජාණන් වහන්සේ පෙන්නුවා.

ඒ විතරක් නෙමෙයි මේ දිර්ඝ සංසාරෙ අප හැම කෙනෙක් ම මනුෂ්‍ය ආත්ම වලට වඩා ලබලා තියෙන්නේ වැඩිපුර තිරිසන් ආත්ම. ඒ තිරිසන් ආත්ම ලබපු ආත්ම වලදී බෙල්ල කැපුම්, කනකොට බෙලි කැපුම්, කන කොට ගලා ගෙන ගිය ලේ එකතු කරන්න පුළුවන්නම් සතර මහා සාගර ජලයට වැඩි යි කියලා පෙන්නුවා. පෙන්නලා බුදුහාමුදුරුවෝ නැවතත් මෙහෙමත් දේශනා කලා.

මේ පටිච්ච සමුප්පාදය නැමති ධර්මතාවය දන්නා වු මේ සද්ධර්මය ඇසූපිරූ ඇති කෙනෙක් ඇරෙන්න මගේ මේ වචන විශ්වාස කරන්නේ නැහැ. අනෙක් අය කියලා ඒ අයට හිතෙන්නේ මේක අතිශෝක්තියක් මවා පෑමක්, මවා පෙන්වීමක් කියලා. ඇයි මහා සාගරයට වඩා වැඩියි අඬපු කඳුළු කියන කොට.

නමුත් පිනවතුනි, බුදුහාමුදුරුවෝ කියලා කියන්නේ අපිව යහපත් මාර්ගයට ගන්නවත්, බොරු කියන කෙනෙක් නෙමෙයි. බොරුවෙන් උපමා කරන කොනෙක් නෙමෙයි. ඒ තරම් සසර දුකක් අපි හැම කෙනෙක් ම විඳලා තියෙනවා. ඒත් භවයෙන් වැහිලා නිසා අපට පෙන්නේ නැහැ. ඒ විතරක් නෙමෙයි. මේ සංසාරේ එනකොට, ඇස් දෙක අන්ධ වෙලා, ගල් මුල් වල පය හැපි හැපි ජීවිතේ අවසන් වුනු වාරත් ඕනතරම් ඇති. අතපය හතර නැති වෙලා, කොටයක් වගේ වෙලා කිසි කෙනෙකුගේ හව් හරණක් නැතිව ජීවිතේ අවසන් වෙච්ච වාරත් අපේ ඕනතරම් ඇති. ඒ වගේම ජීවත්ව ඉන්නකොට පණුවෝ ගහලා, හොරි කුෂ්ඨ හැදිලා මැරුණු වාරවල් ඕනතරම් ඇති. ගස් ගල් පර්වත වලින් වැටිලා හිස පොඩි වෙලා මැරුණු වාරවල් ඕනතරම් ඇති.

අද සිහි කරලා බලන්න මේ ලෝකේ දිහා මොන තරම් අනතුරු තියෙනවද? මොන තරම් ලෙඩ රෝග වල ප්‍රභේද තියෙනවද? ඒ ඔක්කෝම මේ සසරේ, අපි ඉන්නෙත් මේ සසරේ. ඒ හැම දේකටම නෑදකම් කියන්න පුළුවන් බව අපේ නැති වෙලා නැහැ. ඒත් භවයෙන් වැහිලා නිසා, අවිද්‍යාවෙන් වැහිලා නිසා, අපට මේ සසරේ ඇති භයානක කම තේරෙන්නේ නැහැ.

පින්වතුනි අපේ ජීවිතය ගැන අපි මීට වඩානම් ටිකක් හිතන්න ඕනේ. එකම එක දෙයක් හොඳට සිහිකරලා බලන්න. ඇයි අප ජීවත් වෙන්නේ කියලා. අපි ජීවත් වෙන්නේ මොකට ද කියලා.

අපි උදේ ම නැගිටලා ගෙවල් දොරවල් අස්පස් කරලා ආහාර පාන සකස් කරනවා. කෑම කනවා. මේ ටික ඇයි අපි කරන්නේ? මෙහෙම කර කර ඇයි අප ජීවත් වෙන්නේ? අපි මේ කරන ක්‍රියාවන් ඉතා සියුම් විදියට නිරික්ෂණය කරලා ගවේෂණය කරලා බැලුවොත්, අපිට තේරෙයි අපි හැම කෙනෙක් ම උත්සහවත් වෙන්නේ දුක නැති කරන්න, සැනසීම ලබා ගන්න. ඒත් අපි හැමෝටම ලැබෙන්නේ නැති කරුණත්, ලැබිලා නැති කරුණත්,

දුක නැති කරගන්න එක. සැනසිල්ල ලබාගන්න එක. ඒ සඳහා මාවතක් ද අපි හොයන්නේ නැහැ. ඒකට හේතුව අපිට එහෙම අවශ්‍යතාවක් දැනිලා නැහැ. අපිට අවශ්‍යතාවක් දැනෙන්නේ නැහැ. අපේ වටපිටාවේ හිස් බවක් නොදැනෙන නිසා, අපිට දෙමව්පියෝ ඉන්නවා, දරුවෝ ඉන්නවා, මුණුපුරෝ ඉන්නවා, ආහාර පාන තියෙනවා, ඉන්න හිටින්න වටපිටාව තියෙනවා. මේ ටික තියෙන නිසා අපට පේන්නේ නැහැ. ඒක අපට සිහි කරගන්න නුවණ ශක්තිය මදිවෙලා. අපි වටා තියෙන්නේ මෙහි ධර්මයන්ගේ ආදිනව ටික.

එක්තරා දවසක් එක්තරා කාලෙක එක පවුලක් හිටියා. අම්මයි, තාත්තයි, දුවයි, පුතාලා දෙන්නයි. මේ අම්මයි, තාත්තයි හරි මිත්‍යාදෘෂ්ටිකයි. දහමක් නැහැ. දහමකට කැමති නැහැ. තාත්තා ඒ කුඹුරු වතුපිටි වලටමයි තන්හාව. ඇවිල්ලා උදේ ඉඳන් ඒකමයි කරන්නේ. ඒකට පුදුම ආසාවක්. අම්මා ගෙදර දොරේ වැඩ කටයුතු ටික කරනවා. ගෙදරට පුදුම ආසාවක්. ඒ වත්තේ ලස්සන විලක් තියෙනවා නංගි මේ විලට බොහොම ආසයි. මල්ලිටත් කිසි ම දහමක වුවමනාවක් නැහැ. නමුත් අයියා මේ අය ඔක්කෝටම වඩා වෙනස්. අයියා පන්සලට විහාරස්ථානයට ගිහිල්ලා බණ අහලා ජීවිතේ ගැන කලකිරිලා අයියා මහණ වුනා. මහන වෙලා ටික දවසක් අප්‍රමාදිව කටයුතු කරන කොට සියලු ම කෙලෙස් නසලා මහරහතන් වහන්සේ නමක් බවට පත් වුනා. පත් වුනා ට ගෙදර අය අයියා තමන්ගේ දරුවා වෙනුවෙන් කියලවත් දානයක් දෙන්නේ නැහැ. ශිලා දි ගුණ ධර්මයක් අහලවත් නැහැ.

මේ විදියට කටයුතු කරගෙන ඉන්නකොට කාලයක් යන කොට අම්මත් මැරුණා, තාත්තත් මැරුණා. හදිස්සියේ රෝගයක් හැදිලා නංගිත් මැරුණා. මල්ලි විතරයි ගෙදර දැන්. මල්ලි සියලු ම ධනයට හිමිකරුවෙක් වෙලා. දවසක් මේ රහතන් වහන්සේ ගෙවල් තියෙන පාරේ පිඬුසිඟා වඩිනවා. වඩින කොට මල්ලි තමන්ගේ කුඹුරට ආපු විශාල ඌරෙක් ව මරලා අරගෙන එනවා. හාමුදුරුවෝ එනවා දැකලා ස්වාමිනී අද දවසේ අපේ ගෙදරට දවල්ට දානෙට වඩින්න කියලා ආරාධනා කළා.

මොකක් ද හේතුව? මට විශේෂ ආහාරයක් පූජා කරන්න තියෙනවා. මෙහෙම මස් වගයක් තියෙනවා කියලා. කොහෙන් ද කියලා අහනකොට මේ ඌරෙක් මරලා තියෙන්නේ. රහතන් වහන්සේ කිව්වා හොඳයි ඔය ඌරා කපන්න එපා, මම එනකං තියා ගන්න කිව්වා. හමුදුරුවො ගෙදරට වැඩිනතුරු ඌර තිබ්බ.

හාමුදුරුවො ගෙදරට වැඩියට පස්සෙ ඌර කපන්න ඉස්සර කිව්ව ඔය ඌරගෙ බඩ පලල බලන්න ඌරගෙ බඩ ඇතුලෙ ඇති විශාල ගැරඬියක් කියල. ඊට පස්සෙ ඇත්තටම කියපු විදිහට බලනකොට ඌරගෙ බඩ

ඇතුලෙ විශාල ගැරඬියෙක් ඉන්නව. ඔය ගැරඬියගෙ බඩ පලල බලන්න ඔය ගැරඬියගෙ බඩ ඇතුලෙ ඇති විශාල ගෙම්බෙක්. පලල බලනකොට විශාල ගෙම්බෙක් ඉන්නව. ඊට පස්සෙ කිව්ව දන්නවද ඔය උගර කව්ද කියල? ඔය තමයි ඔයාගෙ තාත්තා. දන්නවද ඔය ගැරඬිය කව්ද කියල? ඒ ඔයාගෙ අම්මා. දන්නවද ඔය ගෙම්බා කව්ද කියල? ඒ තමයි ඔයාගෙ නංගි.

පින්වතුනි සම්මතය කියන්නෙ මේක. අපි මගේ කියල, මම කියල නිෂ්ඵල දේ තුරුළු කරගෙන යම් අය නිසා ප්‍රමාද වෙනවනම්, එහා පැත්තට ගියහම අපේ ජීවිතේ පැහැරගන්න එකිනෙකට ප්‍රතිවිරුද්ධ හතුරෙක් බවට ම පත්වෙන්න පුළුවන් සසර කය අපෙන්. අම්මා, තාත්තා, දුව, පුතා කියල එකම පවුලෙ හිටපු කිහිපදෙනා ඊට එහා පැත්තට ගිහිල්ල තමන්ගෙ ජීවිතේම ආහාරයක් කරගන්න මට්ටමට පත්වුනා. මේකෙන් මේ කතාව අහල මල්ලි හරිම සංවේගයට පත්වුනා. ඉතින් මේ මහරහතන් වහන්සේ ඒකම උදව් කරගෙන සද්ධර්මය දේශනා කළා. සම්මතය කියන එක තේරුම් ගන්න ඕනවට වඩා ඒ තුළ ගිලෙන්න එපා, ප්‍රමාදවෙන්න එපා.

මේකෙන් මේ පින්වතුන්ටත් මට මතක් කරන්න තියෙන්නෙ මේ පින්වතුන්ගෙ ජීවිතත් ගෙවෙන්නෙ මේ බුද්ධෝත්පාද කාලෙ මනුස්ස ජීවිතයක් ලැබිල සසර දුක නිමාකරන සද්ධර්මය තියෙද්දිත් තමන්ගෙ දරුවො, මුනුපුරෝ, ගෙවල් දොරවල් කියන මේව නිසානම් තේරුම්ගන්න හරිම අවාසනාවන්ත වටපිටාවක් අපිට තියෙන්නෙ කියල. ඒකාන්තයෙන්ම නොවුවමනා ලැබීමක් අපිට තියෙන්නෙ කියල.

බුදුරජාණන් වහන්සේ දේශනා කරනව "**වුත්තා මත්ති ධනං මත්තී ඉති බාලෝ උයංඤතී අත්තාහි අත්තනෝ නත්තී බුතෝ පුත්තෝ බුතෝ ධනං**" මට පුත්‍රයන් ඉන්නවා, ධනය තියෙනව කියල නුවණ නැති කෙනා ලෝකෙ වෙහෙසෙනව කියල. "**අත්තාහි අත්තනෝ නත්තී බුතෝ පුත්තෝ බුතෝ දනං**" තමාට තමාවත් නැති වෙනකොට අපි මම මම කියල, මගේ මගේ කියල ඇසුරු කරන මේ ශරීරයත් ඉදිමිලා, නිල්වෙලා, පුපුරල ඕජස් ගලල පොලවට පස් වෙනවනම් යම් දවසක "**බුතෝ පුත්තෝ බුතෝ ධනං**" දරුවො කොහින්ද, පුතෙක් කොහින්ද කියල අහනව. ඇයි පින්වතුන් මේ ගැන හිතන්නෙ නැත්තේ? ඇයි ගතානුගතිකව දුවන සමාජ රටාවට එකතුවෙලා ඔහේ දුවන්නෙ? ඉදිරියෙන් යන එක්කෙනා එක්කෙනා මැරි මැරී වැටෙනව අපිට පේනව. ඇයි අපිට ඒ ගැන හිතෙන්නෙ නැත්තෙ? ලෝවැඩ සඟරාවෙ පෙන්නනව කවියක් වීදාගම හාමුදුරුවො,

"අසල් ගේක හොරකම් ගිය දවසක
කුහක සිතින් සිඳිනේ තම ගෙය රැක
සියල් සතුන් මරු ගෙනයනවා දැක
කුසල් නොකර ඉඳිනේ ඇයි නොවැසැක"

අපේ ගෙදරට අල්ලපු ගෙදරට හොරෙක් පැනල බඩු මුට්ටු පැහැරගෙන හොරකම් කරගෙන ගියොත්, හෙට දවසෙ අපේ ගෙදරට පනියි කියල සැක සහගත සිතින් නිදාගන්නෙත් නැතුව ඇහැරගෙන ඉන්නවලු. ඒත් එක්කෙනා දෙන්න මැරි මැරී යනව කිසිම සැකක් නැතුව බයක් නැතුව ඉන්නවලු. ඇයි ඒ? අපි ගාව තියෙන කෙලෙස්වල සොභාවය තමයි අනිත් අය මැරුනත් අපි මැරෙන්නෙ නෑ කියන හැඟීමක් අපිට තියෙන්නෙ. ඒක ක්ලේෂයක සොභාවය. නුවණින් ජීවිතය දිනුව මිසක, කිසිම දවසක කිසිම කෙනෙක් මේ හිත කියන කියන දේ කරල දිනුවෙ නෑ මේ සසරෙ.

ඉතින් මම මෙතනදි මතක් කලේ මේ ටික බුද්ධෝත්පාද කාලයක් වුනාට සමහරවිටක අපේ ජීවිත ගෙවෙන්නෙ අබුද්ධෝත්පාද කාලෙක විදිහට. ඕගොල්ලො විශ්වාසෙ තියාගෙන තියෙන්නෙ දරුමල්ලො මුනුපුරෝ ගැනනම්, දේපොල, වස්තුව, හරකබාන ගැනනම් මේ විශ්වාසය බොහොම පටු විශ්වාසයක්.

යමෙක් නිසා ඕගොල්ලො ප්‍රමාද වෙනවනම් ඕගොල්ලො තේරුම්ගන්න ඕගොල්ලො දුකට වැටුනු දවසට කවුරුවත් බේරගන්න එන්නෙ නැහැ. මරණෙන් පස්සෙ පැත්තකින් තබන්න මේ ජීවිතේ මේ කය අබල දුබල වෙලා, වලංගු නැති වෙලා. ටික ටික ජරා ජීර්ණ තත්වෙට පත්වෙනකොට, තමන්ට ගොඩක් ආදරෙයි කියනවනම්, තමන් ගොඩක් ආදරෙයි කියනවනම් ඒ දරුවන්ට කියන්න, පුතේ උඹ මට ආදරෙයි නම් මගෙ මහලු බවින් ටිකක් අරගෙන මාව නිදහස් කරන්න. පුළුවන්ද? බැහැ. මේ කයට හරි හිතට හරි අධිකව දුක් වේදනාවක් දැනුනොත් පුතේ උඹ මගෙ දරුවනම් මට ආදරේනම් මේකෙන් ටිකක් දෙන්න පුළුවන්ද? බැහැ. ඇයි ඒ? ඕනවට වඩා අපි මෝඩවෙන්න, හොඳට තේරෙනව හොඳට පේනව අපේ ජීවිත අප සතුමයි කියල.

ඒ හින්ද මේ පින්වතුන් තමන් තමන්ට පිහිටක් කරගන්න. තමන් ලෝකෙට පිහිටක් කලා, උපකාරයක් කලා. දැන් හැම කෙනාම තමන්ටත් පිහිටක් කරගන්න. මේ මුළු ලෝකෙම දුක නැති කරන්න නොයෙක් ක්‍රම අනුගමනය කරනව. අපිත් ඒ ලෝකයා අතරෙ තවත් එක චරිතයක් වෙලා මිසක ඇත්තටම ජීවිතේ ගැන නුවණින් තේරුම්ගන්න ජීවිතයක් අපේ ගොනුවෙලා නෑ. මම මේ ටික මතක් කලේ අපිට සද්ධර්මයේ වටිනාකම තේරෙන්නෙ මේ ජීවිතේ යම් පමණක හෝ නිසරු බව දැක්ක කෙනෙකුටයි.

මේ බුදුහාමුදුරුවො දේශනා කළ නිසා හෝ මේ ස්වාමීන් වහන්සේල කියන හින්ද නෙමෙයි මේ පිංවතුන් මේ පිංවතුන්ගෙ ජීවිතෙන්ම ප්‍රශ්න කරල බලන්න, අහල බලන්න. අහල බලල ඇත්තටම මේව තමාට සදාතනිකව පරිහරණය කරන්න පුළුවන්නම් වෙනසක් ඕන නෑ ඔහොම ඉන්න. නමුත් තමන්ට හොඳට තේරෙනව නුවණින් හිතුවොත් මේව ඔක්කොම නිශ්ඵලයි කියන එක. ඊලඟට මෙතන තියෙන ප්‍රශ්නෙ

සසරෙදි අපට කවදා හරි මේ මට්ටම ම ලැබෙනවනම් ඒත් කමක් නෑ ඒත් දුකයි නොකිය යුතුයි තව. එහෙම වෙන්නෙ නැහැ.

ඉතින් අද මේ දුක නැතිකරන සද්ධර්මය තියන මේ මොහොත අතහැරගන්න එපා. අතහැරගත්තොත් අපට අර කපුටට වෙච්ච දේ වෙයි.

මතකද කපුටගෙ කතාව? ආපහු මම කියන්නම්. ඔන්න ඉස්සර හිමාල කැලේ මහ විශාල සද්ධන්ත ඇතෙක් මැරිල හිටිය. ඒ කාලෙ දවස් ගානක් එකදිගට වහින මහ විශාල වැස්සක් වැහැල වැහැල මහ විශාල ජලකඳක් මතුවුනා. මතුවෙලා මේ ජලකඳ කොච්චරද කියනවනම් අර ඇත් කුණ පාවෙන්න ගත්ත. මේ ඇත් කුණ පාවෙලා පාවෙලා ඇවිල්ල වැටුන ගංගානම් ගඟට. ගංගානම් ගඟට වැටුනු මේ ඇත් කුණ ගඟේ පහතට ටික ටික ගලාගෙන එනව. ටිකෙන් ටික හිමින් හිමින් ඇත් කුණ ගහගෙන එනව. දැන් කපුටෙක් කෑමක් හොයාගෙන යනව. කපුටෙක් කියන්නෙ සොභාවයෙන්ම කෑදර සතෙක්නෙ. යනකොට ඇත් කුණ දැක්ක. දැකල ඇත් කුණේ වැහුව. වහල හොටින් හම ඉරල මස් ටිකක් කෑව. බොහොම රහයි. පිපාසය ඇතිවුනා ඒ ගමන්ම ගඟෙන් හොට දාල වතුර ටිකකුත් බිව්ව. දැන් කපුටට හිතෙනව කවර මෝඩයෙක් මේ තරම් කන්න බොන්න තැනක් තියෙද්දි දාල යයිද. දැන් මම නම් කොහෙවත් යන්නෙ නැහැ කියල වාසස්ථානය කරගත්ත අර ඇත් කුණ. දැන් කපුට කොහෙවත් යන්නෙ නැහැ යන අදහස අතහැරුන. දැන් කපුට ඇත් කුණේ වහල ඉන්නව, මස් කනව, වතුර බොනව. කපුට ඇත් කුණේ වහල හිටියට ඇත් කුණ නතර වෙලා නැහැ. ඇත් කුණ ටිකින් ටික හිමින් හිමින් පහතට ගලාගෙන එනව. පහතට ගහගෙන එනකොට මේ ඇත් කුණ ඇවිල්ල වැටුන මුහුදට. මුහුදෙත් රැල්ලෙන් රැල්ලට හසුවෙලා කෙනෙක් ගියොත් ආපහු එන්න බැරිතරම් දුරට ගියා. දැන් මේ ඇත් කුණ හැමදාම තියෙන එකක් නෙමෙයි යටින් මාළු කාල ලුණු වතුරට දියවෙලා ඇත් කුණ ඉවරවෙන්න ගත්ත. දැන් පොඩි හම් කෑලි ටිකක් විතරයි තියෙන්නෙ. මේකෙ තමයි මේ එල්ලිලා ඉන්නෙ. දැන් කපුටට තේරුනා දැන්නම් හැමදාම ඉන්න පුළුවන්කමක් නැහැ. බේරිලා යන්න ඕනෙ කියල හිතුන, හිතිල අර හම් කෑල්ල අතහැරලා අහසට නැග්ග. පියාඹල උතුරු පැත්තට, දකුණු පැත්තට, හතර දිශාවටම ගියා ගොඩබිමක් පේන මානයක් නැහැ. ආපහු හිටපු තැනට එන්න හදනකොට ඒ හම් කෑල්ලත් මාළු කාල. දැන් හිටපු තැනත් නැහැ, යන්න තැනත් නැහැ දෙපැත්තෙන්ම පිරිහිච්ච මේ කපුටට මොකද වුනේ? මහා ජල සාගරයට ඇදගෙන වැටුන. වැටෙනකොටම ඒ සාගරයේ ඉන්නව සැඩ මත්සයො. උන් කොටල මේ කපුටව කෑලි කෑලි වලට කඩල ගත්ත විනාශ කෙරුව.

ඉතින් හිමාලයේ හිත දියුණු කරපු ඍෂිවරයෙක් උඩින් යනව මනුස්ස පථයකට ලුණු ඇඹුල් හොයාගෙන. යනකොට දැක්ක මුහුද මැද්දෙ කපුටු තටු වගයක් තියෙනව. මෙයා කල්පනා කරනව සතෙකුට මෙච්චර

දුර එන්න බැහැ. ගොඩබිමක තියෙන තටුවක් මේ තරම් දුරකට ගහගෙන එන්නෙත් නැහැ. කොහොමද මේක ආවෙ කියල දිවැසින් ආවර්ජනය කරල බලනකොට දැක්ක මේ සිද්ධිය. මේ මුළු ලෝකයාම කරන්නෙ මේ කපුට ඇත් කුණේ වහන එකම නේද කියල ඔය කතාව උපමා කරල බණ කියල එදා අබුද්ධෝත්පාද කාලෙක රාජ්‍යයන් හතක් අත්හැරල ගියා කියල මේ ධර්මයේ සඳහන් වෙනව.

ඒ තරම් සංවේගයක් ඇතිකරගෙන ජීවිතේ ගැන. ඒ හැමෝම බ්‍රහ්ම ලෝකෙ ගියා කියල පෙන්නනව එදා නිවන් මග තිබුනේ නැහැ කියල පෙන්නනව.

දැන් පින්වතුනේ අපිත් ඔය ටිකම කරනව. ඇත් කුණ වගේ මොකක්ද අපිට මේ ජීවිතේ ජීවත් කරන්න ලැබිච්ච වටපිටාව. ගෙවල් දොරවල්, ඉඩකඩම් තියෙනවනම්, තමන්ට තියෙන මේ ශරීරය තියෙනවනම් මේ සියල්ල අර ඇත් කුණ වගේ. දැන් කපුට ඇත් කුණේ වහල මස් කෑවට වරදක් නැහැ. මස් කාලම නිතරම මේකෙන් යන බලාපොරොත්තුවෙන්. මස් කාල මුහුදට වැටෙන්න කිට්ටු වෙනකනුත් මස් කාල වැටෙන්න කිට්ටුව හරි උෟ අතහැරල ගියානම් ප්‍රශ්නයක් නැහැ. නේද? නමුත් කපුට ඇත් කුණේ වහල මේ වගේ තැනක් කවර මෝඩයෙක්නම් දාල යයි කියල හිතුවනෙ. ඒ හිතීමත් එක්කම එයාට මිදීම අත්හැරුන. ඒවගේ කපුට ඇත් කුණේ වැහුව වගේ තමයි, ඇත් කුණ තමයි මේ දේපල වස්තුව මගේ කියල ජීවිතේ. කපුට ඇත් කුණේ වැහුව වගේ තමයි දැන් මගේ ගෙදර, මගේ දරුව, මගේ දුවා, මගේ පුතා මේ මම කියල බදාගෙනම ඉන්නෙ දැන්. දැන් මිදෙන අදහසක් නැහැ කාටවත්. දැන් කපුට ඇත් කුණේ වැහුවට ඇත් කුණ නතර වෙලාද? ඇත් කුණ නතර වෙලා නැහැ. දැන් මේව මගේ මගේ කියල තන්හාවෙන් අල්ලගෙන හිටියට ජීවිතේ නතරවෙලා නැහැ. ටිකින් ටික හිමින් හිමින් මේ ජීවිතයත් පහතට ගලාගෙන යනව. මේ කොච්චර දුර යනවද? ගිය කෙනෙක් ආපහු එන්න බැරිතරම් දුරට යනව. ගිහිල්ල ඔන්න කිසීම දෙයක් කරගන්න බැරි, ශරීරය අබල දුබල වෙලා සිහිය නැති වටපිටාව තැන දක්වා ගියහම බොහෝ දෙනෙකුට හිතෙනව ඇත්තටම මේ ජීවිතේ අනිත්‍යය යි නේද? මේක වැඩක් නැහැ නේද? නිසරුයි නේද? කියල හිතෙනව. එදාට යන්න එන්න තැනක් නැහැ. අර හතර දිශාවෙ ගොඩබිම පේන්නෙ නැහැ වගේ බණ අහන්න බැහැ කන් ඇහෙන්නෙ නැහැ, පන්සලකට යන්න බැහැ අතපය වලංගු නැහැ, දහමක් තේරුම් ගන්න බැහැ මතකය අඩුයි.

එතකොට මේ වගේ ඒ හැම පැත්තක්ම පිරිහිලා. විමුක්තිය පැත්ත සම්පූර්ණ ඇහිරිලා. ඊට පස්සෙ මම මම කියල මගේ මගේ කියල හිතාගෙන හිටපු භෞතික දේත් අතහැරෙනව අපිට. විමුක්තියත් අතහැරෙනව. දෙපැත්තෙන්ම අතහැරුනහම අපි සංසාර සාගරේට ඇදගෙන වැටෙනව.

ඒ සංසාර සාගරේට ඇදගෙන වැටුනහම සංසාර සාගරේ ඉන්නව ජරා, මරණ කියල සැඩ මත්ස්‍යයො. ඒවට අහුවෙලා ජීවිතේ සුනුවිසුනු වෙලා යනව.

දරුවො මැරිල අඬනව පපුවෙ අත් ගගහ. ඒත් කිසිම ගානක් නැහැ. තේරුම් ගන්න මේ සසර ඕගොල්ලො ඔක්කොම ඉන්නෙත් මේ සසරෙ. ඔහොම අඬපු වාරවල් ඕනතරම් ඇති. ඒත් දැන් බය නැහැ. අපිට ඒ ගැන හිතෙන්නෙවත් නැහැ. එහෙම වෙන්නෙ නැහැ වගේ අපි ඉන්නෙ. බණ අහනකොට නම් ඇත්ත තමයි කියල හිතෙනව, බණ ඉවර වුනාට පස්සෙ ආයි කපුටමම වෙනව.

ඔන්න මම දැන් මේ බාහිර කරුණු ටිකක් කිව්ව. දැන් මම දහමෙන් ටිකක් කියන්නම්. ඉතින් මම මේ ටික කිව්වෙ යථාර්තය මෙබඳු වුනාට අවිද්‍යාවෙන් වැහුණු මේ ලෝකෙට මේක තේරුම් ගන්න බැරිවෙලා. අපිත් දුවන්නන් වාලේ ඔහේ දුවනවනම් අපේ ජීවිතවල තේරුමක් නැහැ. බොහෝම කලාතුරකින් කෙනෙක් තමයි හිතල බලල කටයුතු කරන්නෙ. බොහොම දෙනෙක් නිතරම ඉපදිලා සසරෙ නිතරම දුවන අය. එබඳු ලෝකය අතුරින් පරතෙරට යන්නෙ බොහෝම කලාතුරකින්. මේ පින්වතුන්ටත් පුළුවන්නම් මේ බුද්ධෝත්පාද කාලයේ සසර පරතෙරක් දකින මානසික මට්ටමක් ඇතිකරගන්න මේ ලබපු ජීවිතේ රිසි නැහැ. බුදුරජාණන් වහන්සේල පහල වෙන්නෙ ඒ වගේ අය හින්ද.

ඉතින් සසර මේ තරම් දුක් සහගතයි. මේ දුක් සහගත සසරෙන් මිදෙන්න අපි හැමෝම උත්සහවන්ත වෙමු.

නමුත් උත්සහවන්ත වුනාට දුකින් මිදෙන්න බැරිවුනා. අදත් මේ බඩගින්න, පිපාසය, කකුල් කැක්කුම්, ඔලුව කැක්කුම් මේ මේ වේදනා දුක් තියෙනව නේ? තියෙනව. හිත් අමනාපකම්, ප්‍රියයන්ගෙන් වෙන්වීම, මහළු බව, මරණ මේ දුක් තියෙනව නේ? ඉතින් මුළු ජීවිතේ පුරාවටම දුකින් මිදෙන්න උත්සහවත් වුනත් අපිට දුක නැතිකරගන්න බැරිවුනා. ඇයි ඒ බැරිවුනේ? මම කිව්ව දුක නැතිකරන්න අපි මොකක් හරි කළා මිසක මොකක්ද දුක නැතිකරන්න කළේ කියල හොයල නෙමෙයි කරන්නෙ.

වහින වෙලාවට මේ වහල හිල්වෙලා තෙමෙනව කියන්නකො. දැන් ප්‍රශ්නයක් තියෙනව තෙමෙනව. අවශ්‍යතාවයකුත් තියෙනව, නොතෙමෙන්න ඕනෙ. දැන් අපි උත්තරේ දන්නව. මොකක්ද? වහලෙ හිල්වෙලා ඒක හදන්න ඕනෙ. දැන් හිල්වෙලා තියෙන්නෙ කොහෙද කියල බලන්නෙ නැහැ වහල වහන්න ඕනෙ කියලනෙ උත්තරේ ආවෙ. ඉතින් දැන් මේ හරියෙ තෙමෙන්නෙ කොහේ හරි වහනව වහලෙ. අර කාමරයෙ ළඟින් තියනව ගිහිල්ල උළුකැටයක්. හරිද එතකොට නොතෙමී ඉන්න පුළුවන් ද? කවුරු හරි ඇහුවොත් අපි කියනව බලන්නකො මේ ගේ

තෙමෙනව මෙච්චර වහලෙත් වැහුවනෙ කියලත් කියනව. නමුත් තෙමෙනව. ඕකයි හැමදාම කරන්නෙ.

නමුත් නොතෙමී ඉන්නනම් වහලෙ හිල්වෙච්ච තැන වහන්න ඕනෙ. හිල්වෙච්ච තැන හොයන්න ඕනෙ. ඒක වහන්න ඉස්සෙල්ල කොතනද හිල්වෙලා තියෙන්නෙ කියල හොයන්න වෙනව. නේද? ඒවගේ දුක නැතිකරන්න ඉස්සෙල්ල දුක් ඇතිවෙලා තියෙන්නෙ කොහොමද කියල බලන්න. අපේ ජීවිතේට දුක එන්නෙ කොහොමද කියල බලන්න. ඒක මම බොහොම සරල උපමාවකින් කියන්නම්.

චතුරාර්ය සත්‍යය අපි අහල තියෙනව දුක, දුක ඇතිවීම, නැතිවීම, නැතිකරන මාර්ගය. වචන ටික ඔක්කොම දන්නවනෙ අපි. එත් අර්ථයයි නැත්තෙ අපේ ජීවිතේ. මම උපමාවකින් කියනව. මේ උපමාව කිව්වම ටිකක් තේරෙයි.

මේ පින්වතුන් ගාව තියෙනව කියල හිතන්න හම්බුනා කියල හිතන්න වටිනා මැණිකක්. කෝටි ගණනක් විතර වටිනව. ඔන්න මැණිකක් කියල දකිනකොට වටිනාකමක් එනව අපිට. දැන් වටිනාකම තියෙනව කෝටි ගණනක්. දැන් කෝටි ගණනක් වටිනා මැණිකක් හම්බවුනහම මේකට කැමැත්ත ඇතිකරගන්න ඕන නැහැ. ඇති වෙනව. වටිනාකමක් ඇතිවුනහම ඒකට ඉබේම කැමතී. ඔන්න දැන් කැමති වුනහම ඒක අපි උරුම කරගන්නව. මගේ කරගන්නව. කාටවත් දෙන්න, තව කවුරුවත් ගන්නවට කැමති නැහැ. කැමැත්තට කියනව තණ්හාව. තණ්හා පච්චයා උපාදානං. දැඩිව ගන්නවා. ගත්තහම මගේ දේ වුනහම දැඩි මසුරුකම් ඇතිවෙනව. අනුන්ගෙ එකකට වඩා බලවත් කැමැත්තක්. මසුරුකම යෙදුනහම දැන් අපි මේක ආරක්ෂා කරනව. දැන් ගෙදර කබඩ් එකේ දානව, එතනින් කවුරුහරි ගනියි කියල මෙට්ටෙ යටත් දානව. ඉතින් ඔහොම දැන් ගේ ඉඩ මදි හංගන්න. දැන් මේක රකින්න හැකියාවක් ඇති මට්ටමට තුවක්කුවක් ගන්න පුළුවන් කෙනා තුවක්කුවක් ගන්නව, කඩුවක් ගන්න පුළුවන් කෙනා කඩුවක් ගන්නව. එහෙම නැති කෙනා දණ්ඩක් හරි ළඟ තියාගන්නව. දැන් මේ මැණික ගන්න කවුරුහරි ආවොත් තුවක්කුව තියෙන කෙනා වෙඩිතියන් නැද්ද? වෙඩිතියනව. කඩු කිනිසි තියෙන කෙනා කපන්නෙ කොටන්නෙ නැද්ද? කොටනව. ලීයක් පොල්ලක් තියෙන කෙනා ගහන් නැද්ද? ගහනව.

දැන් බලන්න පුද්ගලය රළු වෙලා තියෙන්නෙ, දැඩි වෙලා තියෙන්නෙ, පරුෂ වෙලා තියෙන්නෙ ඉබේම. නරක වචන, නපුරු වචන කියල මේක රකින්න පුළුවන්නම් බනින් නැද්ද? බැනල හරි බේරගන්නව. ඔන්න දැන් මේව ඉබේම වෙලා. දැක්කෙ මැණිකක් කියල විතරයි, වටිනාකම ආවෙ ඉබේමයි, වටිනව කියල කැමැත්ත ආවෙ ඉබේමයි, කැමති වුනහම ඒක මගේ වුනේ ඉබේමයි, මගේ වුනහම ඒක ආරක්ෂා කරන මට්ටමට ආවෙ

ඉබේමයි, ආරක්ෂා කරන්න වුනහම දඬුමුගුරු ගන්න වුනේ ඉබේමයි, දඬුමුගුරු අරන් යමක් ආරක්ෂා කරන පුද්ගලය රළු වුනේ ඉබේමයි.

මේ ගැන බුදුහාමුදුරුවො දීඝ නිකායෙ මහනිධාන කියන සූත්‍රයෙන් පෙන්වනව. දැන් තා තෝ කියන වචන, නපුරු වචන, නරක වචන කියන තැනටම රළු වෙලා. දැන් මේ තරම් වටිනාකමින් රකින මේ මැණික නැති වුනොත් මක්වෙයිද? දුකක් එන්නැත්ද? එනව. පපුවෙ අත්ගසමින් අඬන මට්ටමේ දුකක් එන් නැතිවෙයිද? එයි. සිහිනැතිවෙන කලන්තෙ හැදෙන තැනට පත්වෙයිද? වෙයි. ඔන්න දැන් රකින දේ මෙලොවම නැති වුනොත් ඒකත් මහා දුකක්. මේක රකින්නත් වෙහෙසක් දරනව. නිදහසේ කෑම කන්න බැහැ, නිදහසේ ගමනක් යන්න බැහැ, නිදහසේ නිදාගන්න බැහැ, නිදහසේ කෙනෙක්ව ඇසුරු කරන්න බැහැ. අල්ලපු ගෙදර කෙනා ආවත් සැකයි. ඒයාට යන්න දෙන්නෙ නැහැ ඒ පැත්තටවත්.

ඒ දුකත් පැත්තකින් තබන්න. දැන් මේ ගොඩක් ආසාවෙන් රකින දේ නැතිවුනොත් මෙලෝම දුකයි. තිබුනොත් මේ දේ තියෙද්දි තමන්ට මැරෙන්න වෙනව. එතකොට මේ තරම් වටිනා දේකට ආශාවෙන් මැරුනහම ඊට පස්සෙ මොකද වෙන්නෙ? මහා පෙරේතයෙක් වෙලා උපදින්නෙ. ඊට පස්සෙ මේ ආරක්ෂා කරන දේ තිබුනොත් පරලොව දුක, නැතිවුනොත් මෙලොවම දුක. එහෙනම් දැන් දුකින් බේරෙන්න ක්‍රමයක් නැහැ. මේ දේ තිබීම නිසාත් දුකින් මිදෙන්න විදිහක් නැහැ, නැති බව නිසත් දුකින් මිදෙන්න විදිහක් නැහැ. ඇතිබව හා නැතිබව යන දෙකෙන්ම අපේ ජීවිතේට එනව දුක. සමස්ථයක් වශයෙන් අන්තිමට යථාර්තය මොකක්ද? මේ අපි නොදන්නව වුනාට දුක නෙමෙයිද රැකල තියෙන්නෙ?

පළඟැටිය කැමති ආලෝකයට, පහන් දැල්ලට. පහන් දැල්ල කියන්නෙත් දුකක්. ඒත් ඒ සතා දන්නෙ නැහැ මම කැමති වෙලා තියෙන්නෙ දුකට නේද කියල. ඒ සතා පහන් දැල්ලට කැමතී. කැමති දේ ලබාගන්නව කියන්නෙ පහන් දැල්ලට පනිනව. පනිනකොට පිච්චෙනව. දුක එනව. නමුත් එයාගෙන් ඇහුවොත් එයාවත් කැමති නැහැ දුකට. එයා කැමති පහන් දැල්ලට නමුත් පහන් දැල්ල කියන්නෙ දුකක්. එහෙනම් මම කැමතිවෙලා තියෙන්නෙ දුකට නේද කියල දන්නැහැ. අපි කැමති නැහැ දුකට අපි කැමතී මැණිකට. නමුත් මැණික කියන එක ඇති බව නිසා හෝ නැති බව නිසා එන්නෙ දුක. එහෙනම් අපි කැමතිවෙලා තියෙන්නෙ දුකට නේද? මේ ටික ගලපගන්න බැහැ.

බුදුරජාණන් වහන්සේ පෙන්නුව දුක කියන එක ඇතිබව නිසත්, නැතිබව නිසත් දුක එනව. දුක කියන එක උපන්නට පස්සෙ දුකේ නැති බව අපට සැපක් වෙන්නෙ නැහැ. දුකේ නැති බවත් දුකක් එන්නෙ.

අපිට දරුවෙක් මුනුපුරෙක් හිටියොත් මේ අය ජීවත් කරවන්න උපන්න දවසෙ ඉඳල මහ විශාල දුකක් විඳියි අපි. ඒවගේ දුක් විඳිල අපි මේ දරුව ඇතිදැඩි කලොත් මේ දරුව නැතිවුනා කියල ඒ දුක අපිට නැතිවෙන්නෙ නැහැ. ඊට වඩා වැඩි දුකක් උපදිනව මිසක. ඒ වගේ දුක කියන එකේ නැති බවත් ඇති බවත් දෙකම දුක බුදුරජාණන් වහන්සේ පෙන්නුව.

දුක කියන දේ අපිට ඉබේම ගලා ආව නෙමෙයි දුක කියන තැන ධර්මතාවයක් තිබුන. පුද්ගලයෙක් කළා නෙමෙයි. අනාත්මයි කියන්නෙ ඒකයි. එකින් එක එකින් එක පිරෙන සිද්ධියක් තිබුන. මැණිකක් කියන එක විතරයි දැක්කෙ. වටිනාකම ආවෙ නිරායාසයෙන්. වටිනව කියනකොට වටිනාකමට කැමැත්ත ආවෙ නිරායාසයෙන්. කැමති දේ මගේ වුනේ ඉබේම. මගේ දේ ආරක්ෂා කරන්න වුනේ ඉබේම. ආරක්ෂා කරන්න දඬුමුගුරු ගන්නවයි කියන දේ වුනේ ඉබේම. එහෙම ආරක්ෂා කරන දේක ඇති බව හා නැති බව යන දෙකම දුක එන බව ආවෙ ඉබේම.

ඔන්න දැන් මේ මැණික ඇති බව හා නැති බව නිසා දුකක් එනවනම්, මේ දුකෙන් මිගොල්ලන්ට මිදෙන්න හොඳට කෑම කාල පුළුවන්ද? බැහැ. ප්‍රියමනාප චිත්‍රපටියක් බලල පුළුවන්ද? බැහැ. එහෙනම් බොහොම සුඛෝපභෝගී ගෙයක් දොරක් හදාගෙන මිදෙන්න පුළුවන්ද? මේ මැණික නිසා ඒ තුළ ගලාගෙන ආපු සිද්ධියක් තිබුන. මේ සිද්ධිය දුරු නොකොට මේ දුකෙන් මිදෙන්න වෙන දෙයක් කරල පුළුවන්ද? බැහැ.

දැන් මේ වගේ මැණික් සියදාහක් අපිට තිබ්බොත්, ආරක්ෂා කරන්න දේවල් බොහොමයක් අපිට තිබුනොත්. අපේ කෙලෙස් සහගත සිත නිසා අපිට පේන්නැහැ. හිතන්න ලෙහෙසි දුකක් නෙමෙයි අපි විඳිනව ඇත්තෙ කියල. එච්චරට ආයාසයක් ඇතිවෙනව.

ඔන්න දැන් දැක්ක මේ මැණික ඇති බව නිසා හෝ නැති බව නිසා දුක ආපු හැටි. පහු කාලයකදි මේ මනුස්සය මේ මැණික විකුණන්න අරගෙන යනව. කඩේකට ගිහිල්ල දුන්නම මේ කඩේ මුදලාලි කියනව අයියෝ මේක මේ වීදුරු ගලක්නෙ කියල. එතකොට කඩේ මනුස්සයත් සැකයි. දැන් වීදුරු ගලක් කියල දකිනකොටම මොකද වුනේ වටිනාකම අඩුවුනා. අඩුකලාද? අඩුවුනාද? වටිනාකම අඩුවෙනකොට කැමැත්ත ඉබේමයි අඩුවුනේ. දැන් මගේ කියල උරුම කරගන්න බව ඉබේමයි අඩුවුනේ. දැන් වෙනද වගේ හංගනවද ගෙනල්ල? දැන් ආරක්ෂාව ඉබේමයි අඩුවුනේ. දැන් මේ වීදුරු ගල රකින්න කඩු කිනිසි ගන්නවද අපි? දැන් නොවටිනව වෙනකොට, ආරක්ෂාව නැතිවෙනකොට පුද්ගලයා නිවිච්ච කෙනෙක් වුනේ ඉබේමයි. දැන් මේ වීදුරු ගල නැතිවීමෙන් පපුවෙ අත්ගසමින් විලාප දෙන දුකක් එයිද අපිට? නැහැ. තිබීම නිසා පෙරේතයෙක් වෙයිද? නැහැ.

එහෙනම් බලන්න හොඳට එකම වස්තුව වීදුරු ගල, මැණිකක් කියල දැකපු නිසා දුක කියන තැනට ගලාගෙන ඇවිල්ල. වීදුරු ගල වීදුරු ගල විදිහට දැක්කහම ඇත්ත ඇතිහැටිය ඉබේම දුක කියන එකෙන් නිදහස් වෙලා අපි. දැන් අපි දැක්ක වරදවා දැක්කහම වෙච්ච දේ. නිවැරදි දේ නිවැරදි ලෙස දැක්කහම දුක නැතිවෙච්ච හැටි.

ඉතින් බුදුරජාණන් වහන්සෙ පෙන්නුවෙ මෙන්න මේ ටික. උන්වහන්සේ පෙන්නුව මේ ලෝකයාට මේ ලෝකෙ දැන් මැණික් වගේ වටිනාකමක් තියෙනව. මේ මම, මේ දුව, මේ පුතා, මේ දේපල වස්තුව, හරකබාන කියල බොහෝම වටිනාකමින් දකින්නෙ. දැන් වටිනාකම නිසා තණ්හාව ඇතිවෙලා තියෙන්නෙ ඉබේම. තණ්හාව නිසා මගේ වෙලා තියෙන්නෙ ඉබේම. මගේ කරගත්ත දේ ආරක්ෂා කරන්නෙ ඉබේම. දැන් අපි රළු වෙලා තියෙන්නෙ, පරුෂ වෙලා තියෙන්නෙ ඉබේම. දැන් ඔන්න ඔහොම යමක් අපේ ජීවිතේ රකිනවනම් දඬුමුගුරු අරගෙන, මේ දේ ඇති බව නිසා හෝ නැති බව නිසා දුක් විඳින්න වෙනව. ඒවගේ බොහොම ආශාවෙන් රකිනවනම් දකින්න මේක නැතිවුනොත් මෙලොවම දුක් විඳින්න වෙනව. මේක තිබුනොත් පරලොව දුක් විඳින්න වෙනව.

දැන් එහෙනම් අපි මේ දුකට නේද තණ්හා කරන්නෙ කියල අපි දන්නැහැ. අපි ආසයි සල්ලිවලට. සල්ලි කියන්නෙ දුකක් කියල අපි දන්නැහ. අපි ආසයි මේ ජීවිතේට හැබැයි ජීවිතේ කියන්නෙ දුකක් කියල දන්නැහ. අපි හැමදාම මැණිකක් කියල දකිද්දි අපේ දුක නැති කරන්න වෙන ක්‍රම නැහැ. අනිවාර්යයෙන් මේ දුක විඳින්න වෙනවාමයි. තණ්හාව නිසා දුක එනව කියල බුදුහාමුදුරුවො පෙන්නුවෙ ඔන්න ඔය නිසයි. මැණික ඇති බව නිසා හෝ නැති බව නිසා දුක එනවනම්, දුකට හේතුව මේ මැණික නේ? මේ තණ්හාව නැතිවුනොත් මේ දුක නැතිවෙනව. මැණික තිබුනත් නොතිබුනත් අපිට එන දුක නැතිවෙනව. ආර්ය අෂ්ඨාංගික මාර්ගයේ තණ්හාව නැතිකරන මග සම්මා දිට්ඨිය කියල පෙන්නුවෙ එහෙනම් මෙතන තණ්හාව ඇතිවුනේ මැණිකක් කියල දැකපු එකනෙ. එහෙනම් සම්මා දිට්ඨියෙන් වීදුරු ගල වීදුරු ගලක් කියල දකින්න. නිවැරදිව දකින්න. දකිනකොට තණ්හාව නැති වෙනව, දුක නැතිවෙනව කියල ඒකයි මාර්ගය එතනින් පැනෙව්වෙ.

බුදුහාමුදුරුවො දැක්ක මේ ලෝකයාට නිත්‍ය, සැප, ආත්ම කියලයි පේන්නෙ. පේන හින්දයි කැමැත්ත. ඒ හින්දයි මගේ කරගෙන තියෙන්නෙ. ඒ හින්දයි ආරක්ෂා කරන්නෙ. ඒ හින්දයි දඬුමුගුරු ගන්නෙ. ඒ නිසයි දුක ගලාගෙන එන්නෙ. බුදුරජාණන් වහන්සේ දේශනා කළා අර මැණික වීදුරු ගලක් බව පෙන්නපු වෙළඳ මහත්තයව බුදුරජාණන් වහන්සේ පෙන්නනව මේ ලෝකයේ අනිත්‍ය දෙයක්, දුක් දෙයක්, අනාත්ම දෙයක් මේක දකින්න

සම්මා දිට්ඨී. දුක් වූ දෙය දුක හැටියට. අනිත්‍ය වූ දෙය අනිත්‍ය හැටියට, අනාත්ම වූ දෙය අනාත්ම හැටියට දකින්න.

වැරදි දැකීම හා නිවැරදි දැකීම කියන්නෙ මොකක්ද? මහ කළු ගලක් අරගෙන අපි වතුරකට දානව. දැම්මහම මොකද වෙන්නෙ මේ ගලට? යටයනව. එක්කෙනෙක් මේ ගල යටයන්නෙ නැහැ උඩ පාවේවා කියල දක්මකුත් තියෙනව, කෙනෙක් මේ ගල උඩ පාවෙන්නෙ නැහැ යටයනව උඩ පාවෙන්න එපා යටයන්න කියල හිතනව. දැන් එකම සිද්ධිය අරඹයා ප්‍රාර්ථනා දෙකක්. දැන් හොඳට බලන්න මේ ගල උඩ පාවේවා යට නොයේවා කියන මනුස්සය එක්ක තරහටද මේ ගල යට ගියේ? නැහැ. එහෙනම් මේ ගල යටයන්න උඩ පානොවේවා යන පුද්ගලයාට අනුග්‍රහ පිණිසද ගියේ? නැහැ. සිදුවෙන සිද්ධියක් තිබුන. ලෝකයේ ධර්මතාවයක් මේ බර සහගත ගල ජලයට දැම්මහම යටයනව කියන එක. යථාර්තයක් ඒ.

ඒ සිතුවිලි සිද්ධියට පටහැනිව කරපු ප්‍රාර්ථනාව, දක්මට කියනව මිච්ඡාව කියල, වැරදී කියල. ඒ සිදුවන සිද්ධියට අනුව සිතපු එකට කියනව සම්මා කියල, නිවැරදියි කියල. සම්මා දිට්ඨී, මිච්ඡා දිට්ඨී කියල වුනේ එහෙමයි. දෙකම දිට්ඨියක්. මේ දෙකම සිදුවන සිද්ධිය නෙමෙයි. සම්මා දිට්ඨිය කියල පෙන්නපු සිද්ධිය අපිට උපයෝගී කරගෙන සිදුවන සිද්ධිය බවට පත්කරගන්න පුළුවන් අපේ ජීවිතේ.

මිච්ඡා දිට්ඨිය කිව්වොත් අකුසල්, සම්මා දිට්ඨිය කිව්වොත් කුසල්. අපිට පුළුවන් කුසල් වන දේ වන හැටියට සිහිකරල යම් දවසක වෙන සිද්ධිය ජීවිතේ බවට පත්කළොත් ඒ සිද්ධියට කුසල අකුසල කතාවක් නැහැ. ඒක ධර්මතාවයක්. ලෝකයේ අනිත්‍යයි, දුක්ඛයි, අනාත්මයි කියල පවතිනවනම් යම් ධර්මතාවයක් ඒ වූ ධර්මතාවය වූ විදිහට දැක්කොත් අපි මේකට කියනව දැකීම නිවැරදියි සම්මා දිට්ඨිය. එහෙම දැක්කහම තණ්හාව නැහැ. තණ්හාව නැතිවුනොත් දුක නැතිවන බව බුදුරජාණන් වහන්සේ පෙන්නුව.

එහෙනම් මේ පින්වතුන් මනුෂ්‍යයෙක් හැටියට, විශේෂයෙන් බෞද්ධයෙක් හැටියට මේ ටිකවත් තේරෙන්න ඕනෙ අපිට. මුළු ලෝකයම දකින්නෙ දුකට හේතුව බාහිරින් භෞතික දෙයින්. දේපොල වස්තුව නැතිවුනොත්, ගෙවල් දොරවල් නැතිවුනොත්, හරකබාන නැතිවුනොත් තමයි දුක විඳින්න වෙන්නෙ, දුක එන්නෙ කියල දකින්නෙ. දුකේ නැතිවීම දකින්නෙ ගෙයක් දොරක් හදා ගත්තොත්, හරකබාන හිටයොත් දුක නැතිව ඉන්න පුළුවන් කියලයි අබෞද්ධ ලෝකයා දකින්නෙ. ඉතින් මුළු ලෝකමය දැන් දුක නැතිකරන ප්‍රතිපදාවක් එක්ක හැසිරෙනව. දුක නැතිවෙන්න ගෙවල් හදනව. දුක නැතිවෙන්න දරුවො හදනව. දුක නැතිවෙන්න මිල මුදල් එකතු කරනව. බුදුරජාණන් වහන්සේ දේශනා කළේ ඕකමයි දුක එන්න හේතුව. අනිත් පැත්ත.

බුදුරජාණන් වහන්සේ දේශනා කළා බෞද්ධයො හැටියට දුකට හේතුව තණ්හාව. ඔය මොන දේ එකතු කෙරුවත් වැඩක් නැහැ දුක ඇතිවෙන විදිහටනම් අපි ජීවත්වෙලා තියෙන්නෙ දුක ඇතිවනව. බෞද්ධ කිසිම කෙනෙක් දුක නැතිවෙන්න කියල ගෙවල් දොරවල් හැදුවෙ නැහැ, රස්සාවල් හෙව්වෙ නැහැ, මිල මුදල් එකතු කෙරුවෙ නැහැ. හැබැයි ඒ අය ජීවිතේ ජීවත් කරන්න, තමන්ගෙ යුතුකම් ටික කරන්න රස්සාවක් කළා, ගෙවල් දොරවල් හැදුව, මිල මුදල් එකතු කළා. ඒ ලබපු ජීවිතේ ජීවත් කරන්න. යුතුකම් ටික කරන්න මිසක දුක නැතුව ඉන්න නෙමෙයි. දර්ශනයක් තිබුන බෞද්ධයෙකුට. ඒ හින්ද එයා රස්සාව ජීවිතේ කරගත්තෙ නැහැ. දැන් අපිට වෙලා තියෙන්නෙ අර කාණු හෝදන මනුස්සයට වෙච්ච දේ.

එක්තරා මනුස්සයෙක් කාණු හෝදනව. ඇහුවලු මොකක් නිසාද ඔයා ඕක කරන්නෙ? ජීවත්වෙන්න මහත්තයෝ මේක කරන්නෙ කිව්වලු. තව ටිකක් කතාකරන කොට මෙයා කිව්වලු ඇයි කොහොමද ඔයාගෙ ජීවිතේ ගෙවෙන්නෙ? මහත්තයෝ මම උදේ පාන්දරම එනව මේ පැත්තෙ තියෙන කාණු ටික හෝදගෙන හෝදගෙන යනව අනිත් පැත්තෙන් කාණු ටික හෝදල ඔය ටිකට එනකොට හවස් වෙනව. හවස ගෙදර යනව. මම ඊට පස්සෙ ගෙදර ගිහිල්ල හෙට දවසෙදි කාණු හෝදන ක්‍රමය ගැන හිතනව. හිතල ආපහු පහුවදා උදේට එනව. එතකොට දැන් මේ මනුස්සයගේ ජීවිතය වෙලා තියෙන්නෙ මොකක්ද? දවල් කාලෙ කයින් කාණු හෝදල, රෑට හිතින් කාණු හෝදල අන්තිමට ජීවත් වෙන්න කාණු හෝදපු මනුස්සය කාණු හෝදන්න ජීවත්වෙනව. මේ ජීවිතේ මොනවද ඉතුරු? අන්තිමට වෙලා තියෙන්නෙ ඔච්චරයි.

ඇයි එහෙම වුනේ? ජීවිතේ ජීවත් කරවන්න කාණු හේදුවට කමක් නැහැ. ජීවත්වෙන්න ඕනෙ දහමක් අවබෝධ කරගන්න, දුකෙන් මිදෙන්නනම්. එතකොට මෙයාට ඉඩක් තියෙනව, ඉඩක් ගන්නව, හදාගන්නව. ඇයි? කයින් කාණුව හෝදල නිදහස් වෙච්ච වෙලාවේ හෝ එයා ඊට පස්සෙ ජීවිතේ දුකින් මිදෙන පැත්තට හදාගන්නව. එයා ඒ ටිකේනුත් කාණු හෝදන්නෙ නැහැ. නමුත් අපිට වෙලා තියෙන දේ බලන්න. රස්සාවක් කරයි මේක කෙරුවෙ නැත්නම් ජීවත්වෙන්න විදිහක් නැහැ. ඊට පස්සෙ අපි දන්නෙම නැතුව ජීවිතේ තියෙයි රස්සාවක් කරල. උදේට වැඩට යනව හවස් වෙනකන් ඉන්නව රෑට නිදාගන්න ටිකෙත් ඒකනම් කරන්නෙ ජීවත්වෙනව රස්සාව කරන්න, රස්සාව කරන්නෙ ජීවත්වෙන්න. දෙකම වෙලානම් අපිට බෞද්ධ කියන්න බැහැ. කිව්ව හැකි ඒත් අපි අර්ථයට සුදුසු නැහැ. අපි අර්ථය තියෙන තැන නැහැ. වචන කිවහැකියි නමුත් ඒ දේ නැහැ අපි තුළ. ඉතින් මේ කාරණාව තේරුම්ගන්න

මේ සද්ධර්මය දුක අපේ ජීවිතයට ඇතිවෙච්ච හැටි අවබෝධ කරගන්න බැරිවෙච්ච හින්දයි මේ තාක් අති දීර්ඝ සංසාර ගමනක ආවෙ.

ලෝකයේ අපි බණ අහල හින්ද මේ ටිකවත් දන්නෙ. ලෝකෙක එහෙම දෙයක් දන්නෙම නැහැ. එහෙම දෙයක් නැහැ ලෝකෙ. මේ ගෙවෙන රටාවක් මිසක තමන්ගෙ මේ ලබපු ජීවිතය තමන්ගේ විමුක්තිය පිණිස උදව් කරගන්න. මේ දුවන සමාජ රටාවට අනුව මොනව හරි දෙයක් කරන්න එපා. දුකට පත්වෙච්ච දවසට තමන්ව බේරගන්න කවුරුවත් නැති බව තමන් හොඳට මතක තබාගන්න. මතක තබාගෙන කොහොමහරි මේ දහම අවබෝධ කරගන්න වෙහෙසෙන්න.

එදා කුරු රට බුදුරජාණන් වහන්සේ සතිපට්ඨාණය දේශනා කළා. ඒ සතිපට්ඨාණය දේශනා කරපු කුරු රට වාසී යටත් පිරිසෙන් ගෙවල් වල දැසිදස් කම්කරුවෙක්වත් භාවනා නොකර ඉන්නෙ නැහැ. වතුර ටිකක් ගේන්න කලෙත් අරන් ළිඳට යනකොටත් කමටහනක් මෙනෙහි කර කරලු යන්නෙ. ළිඳ ගාවදි එකතු වෙනවලු කිසිම මුකුත් කේලාම් නැහැ. මැණියනී ඔබ කරන භාවනාව මොකක්ද කියල අහනවලු. මම භාවනාවක් දන්නැහැ කරන්නැහැ කිව්වොත් තගේ ජීවිතේට නින්දා වෙයි. උඹල වගේ අය හින්ද නෙමෙයි බුදුරජාණන් වහන්සේ ලොව පහළ වෙන්නෙ කියල නින්දා කරනව. කරල ඉවරවෙලා මේක කරපන් කියල කියල දෙනවලු. ඉතින් මැණියනී මම අහවල් භාවනාව කරනුව අහවල් විදිහට මෙනෙහි කරනව කිව්වහම සාදු සාදු බොහොම හොඳයි. ඕගොල්ලො වගේ අය වෙනුවෙනුයි ලොව්තුරු බුදුරජාණන් වහන්සේ ලෝකෙ පහළ වුනේ.

ඉතින් අපිට මේක එපානම් අපි උත්සහවත් වෙන්නෙ නැත්නම් ඒ අපි වෙනුවෙන් නෙමෙයි බුදුරජාණන් වහන්සේලා ලෝකෙ පහළ වුනේ. ඇත්තටම සසර පරතෙරක් සොයන, ජීවිතේ තේරුම්ගන්න උත්සහවත් වෙන, ලෝකයා හිතනද්ට වඩා වෙනස්ව හිතන වෙනස් චින්තනයක් තියෙනවනම් ඒ චින්තනය වෙනුවෙන් බුදුහාමුදුරුවො ලෝකෙ පහළ වුනේ. විමුක්තියක් ලබන්න අපේක්ෂාවක් කෙනෙක් ළඟ තියෙනවනම් එයා වෙනුවෙන් බුදුහාමුදුරුවො ලෝකෙ පහළ වුනේ.

ඒ හින්දා මේ පින්වතුන් මේ ජීවිතේ කොහොමහරි මේ දහම අවබෝධ කරගන්න උත්සහවත් වෙන්න ඕනෙ. මෙතන එකම එක දෙයක් හොඳට මතක තබාගන්න, ගැඹුරු දෙයක් බැරිනම් මම කියපු උපමාව මතක තබාගන්න. විටින් විට සිහිකරල බලන්න මගේ ජීවිතේ මේ තැන මේ දැක්ම මෙහෙම වෙලානම් මේ දුක කියන තැනින් මිදෙන්න බෑ මට. පෙරලෙන දෙයක් ඇතුලෙ නොපෙරලී ඉන්න පුළුවන්ද අපිට? බැහැ. මහ විශාල කන්දක් උඩ ඉඳල බස් එකක් පෙරලීගෙන එනවනම් ඒක ඇතුලෙනම් අපි ඉන්නෙ, පෙරලෙනව. පෙරලෙන බෝලයක් ඇතුලෙ නොපෙරලී ඉන්න බැහැ. ඒ වගේ දුක කියන එක ජීවිතේ වෙලානම් දුක ඇතිවෙන විදිහෙ

දර්ශනයක් නම් අපිට තියෙන්නෙ දූන් දුක අනුවම පෙරලෙන්න වෙලා මිසක, දුකට උරුමකාරයෙක් මිසක, ජීවිතේ අපේ දුකේ මිසක අපිට දුකින් මිදෙන්න බැහැ.

අපි පොළොවෙ හිටගත්තහම අපිට ඔක්කෝම පෙනෙයි. එත් හිටගෙන ඉන්න තැන පේන්නෙ නැහැ. ඇයි ඒ? කකුලට වැහිල. අද අපේ ජීවිතේ දුක වෙලා හින්ද අපිට දුක පේන්නෙ නැහැ. ඇයි? වැහිල. ඒ තුලනෙ හිටගෙන ඉන්නෙ අපි. ඔක්කෝම පේනව දුක අපිට පේන්නෙ නැත්තෙ ඇයි? අපේ ජීවිතේ දුක හින්ද. දුක කියන ධර්මතාවය ජීවිතේ හින්ද.

අපිට අපේ ඇහැ පේනවද? පේන්නෙ නැහැ. බලන්නෙ ඒ ඇහෙන් නිසා ඒ ඇහැ පේන්නෙ නැහැ. ඒ ඇහැට ප්‍රතිපක්ෂ දේ පෙනෙයි. නමුත් ඇහැ පෙන්නෙ නැහැ. ඒවගේ කෙනෙකුගෙ ජීවිතේ දුක නම් ඒයට දුක පේන්නෙ නැහැ. ඕගොල්ලන්ට ටිකක් හරි දුක පේනවනම් තේරුම්ගන්න ඕගොල්ලන් දුකෙන් ටිකක් හරි අයින් වෙලා. පේන්නෙ නැහැනෙ මේ දුක බව. තේරුම්ගන්න හොඳට පය ගහල ඉන්නෙ බව. මොකේද? දුකේ. පෙනුනොත් තේරුනොත් තමයි අපි අයින් වෙන්නෙ. එහෙම වෙන්නැත්තෙ මේ ලෝකෙට ඒකයි. එහෙම වෙලා තියෙන්නෙ මේ.

එහෙනම් එකම එක කරුණක් මතක තබාගන්න. ලෝකයේ වටිනාකමින් නම් පේන්නෙ ඒ වටිනාකම නැතිවීමෙන් ම, තණ්හාව නැතිවීමෙන් දුක නැතිවෙනවා මිසක වෙන නැතිවෙන්න ක්‍රමයක් නැහැ. දුක ඇතිවන ක්‍රමයට අපේ ජීවිතේ වෙනවානම් අපි කොච්චර බලාපොරොත්තු වුනත්, ප්‍රාර්ථනා කළත්, වෙන විදිහකට උත්සහ කළත් ඒක නැතිවෙන්නෙ නැහැ. මැණිකක් බව දැකල ඒක රකින බවට පත්වෙලානම් ඒකෙ ඇතිබවින් හා නැතිබවින් දුක එනවනම් අපිට ඒ දුකෙන් මිදෙන්න ඕගොල්ලො රසට කෑම කාල, හොඳට ඇඳුම් ඇඳල මොනදේ කෙරුවත් හරියන්නෙ නැහැ. මේක වීදුරු ගලක් කියල දැකීමෙන් ම ඒ දුකින් මිදෙන්න වෙනව මිසක.

ඒ වගේ දරුවො, දේපල, වස්තුව මේව ඇතිබව හෝ නැතිබව කැඩීම, බිඳීම නිසා ඕගොල්ලන්ගෙ දුකක් එනවනම්, මේ කය ජරා ජීර්ණ වීම නිසා දුකක් එනවනම් මේ දුක නැතිකරන්න කාල බීල, ඇඳල පැළඳල බෑ. මොකද එහෙම නොකිරීම නිසා නෙමෙයි මේ දුක ඇවිල්ල තියෙන්නෙ. මේ කයේ මහළුවීමෙන්, මැරීමෙන් එන දුක ඇතිවුනේ අපි හොඳට කෑවෙ බිව්වෙ නැතිකම හින්දනම්. ඒකනම් හේතුව හොඳට කෑව බිව්වහම මේ දුක නැතිවෙයි. නමුත් මේ දුක ඇතිවෙලා තියෙන්නෙ මේ රූපෙට ඇති තණ්හාව නිසයි.

රහතන් වහන්සේල කියන්නෙ මුළු ලෝකෙම වීදුරු ගලක් වගේ දකින අය. ඒ මනසට ඇලෙන්න ගැටෙන්න මුකුත් නැහැ. ඒ ලෝකෙ දෙයක් තිබීම නිසාවත් නොතිබීම නිසාවත් දුක එන්නෙ නැහැ ඒ තුල. අපිට

මුළු ලෝකෙම මැණික් වෙලා. මේ බව තේරුම්ගන්න බෞද්ධයො හැටියට මේ ජීවිතේ ජීවත් කරවන්න රස්සාවක් කරන්න, ගෙයක් දොරක් හදාගන්න, මුදලුත් එකතු කරන්න. ඒක ජීවිතේ කරගන්න එපා. ඉඩ ලැබෙන හැම මොහොතකම මේ දුකට හේතුව අපි දැන් දැක්ක. අවිද්‍යා, තණ්හා කියන ධර්මතා දෙක. මේ ධර්මතා දෙක දුරුවෙන විදිහට දහමක් හොයන්න උත්සහවත් වෙන්න.

සාධු! සාධු!! සාධු!!!

මෙම ධර්ම දානයට ඔබටත් සහභාගී විය හැකිය. ඒ සඳහා මේ පොත කියවීමෙන් පසු වෙනත් අයෙකුට කියවීමට ලබාදෙන්න

මුද්‍රණය හා බෙදාහැරීම

path.nirvana@gmail.com

www.facebook.com/path.nirvana